# "දිගාමඩුල්ලේ" ආදර්ශමත් ගෙවිලිය

කථාව : වර්ණපාල විමලරත්න. — පින්තුර : එල්. බී. කරුණාරත්න.

ලංකාවෙන් දහයෙන් එකක් පමණ වර්ග ප්‍රමාණයක් ඇති මොණරාගල දිස්ත්‍රික්කය ඓතිහාසික අතින් හා ගොවිතැන අතින් උසුලන්නේ වැදගත් තැනකි. සිංහල ජාතියේ පෞඝ් අතීතයක හපන්කම් කියන සරු සාරවත් පසක් ඇති "පෙරදිග ධාන්‍යාගාර යයි" ශ්‍රී ලංකාව විරුදාවලී ලැබුවේ, පෙර කල සමෘධියෙන් බැබලුන මොණරාගල වැනි පෙදෙස් නිසා යයි දෙස් දෙන නටබුන් වී



දිගාමඩුල්ලේ ආදර්ශමත් ගෙවිලිය

ගිය වැව්, පොකුණු, සිද්ධස්ථාන, සෑම තැනකම දක්නට ඇත. සාමකාමී සමෘධිමත් අතීතයක් තිබූ මෙහි විසූ පැරන්නෝ මෙරට රජකළ විදේශිකයන්ට විරුද්ධව කළ මහ සටන් නිසා කලක පටන් කුඩම්මාගේ සැලකිලි ලබමින් ඔවුන්ගේ ඔද තෙද බිඳ දැමූහ. කොටින් කිවහොත් ගොවිතැනින් උසස් තත්ත්වයක් ඉසුළු මෙම පෙදෙසෙහි තිබූ විශාලතම වාරිමාර්ග ක්‍රමය වන වැව්, අමුණු සිඳ බිඳ කඩා සුන්කළහ. සාමකාමිත්ව යේ සංකේත වූ සිද්ධස්ථාන විනාශ කළහ.

එදා පටන් දිළිඳු බවේ ප්‍රපාතයට වැටුණු මොණරාගල නැතහොත් වෙල්ලස්ස පිළිබඳ කරුණු වර්තමාන පාලකයින්ගේ ඇසට යොමුවීම නිසා අද දියුණුව කරා ක්‍රමයෙන් පිය ඔසවන බව පෙනේ. ගොවිතැන අතින් ලංකාවේ විදේශ විනිමයෙන් විශාල කොටසක් ඉතිරි කරන මොණරාගල දිස්ත්‍රික්කය සඳහා වර්තමාන රජය මගින් සංවර්ධනය සඳහා පියවර රාශියක් තබා ඇත.

ගොවිකම් ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශ හතකට (7) බෙදා වෙන්කර ඇති මෙම දිස්ත්‍රික්කයේ එක් එක් කොටස බැගින් ගෙන විමර්ශණය කළහොත්, මඩුල්ල නැතහොත් "පැරණි දිගා මඩුල්ල" වර්ග සැතපුම් 642 ක් (හයසිය හතලිස් දෙකයි) පමණ විශාල වූ බිම් කොටසකි. අධ්‍යාපනය අතින් නොදියුණුකම නිසාම පැරණි ක්‍රමයට කාලයක් තිස්සේ ගොවිතැන කළ ගොවි ජනයා අද විද්‍යාත්මක ගොවිතැන කෙරෙහි දක්වන්නේ ඉමහත් ඇල්මකි. අවුරුද්දේ මහ කන්නය පමණක් වගා කරණ මෙහි ගොවි ජනයා එයින් උපරිම පල ලබාගැනීමට අමතක නොකරති. මේ නිසා දැන් උනන්දුව පෙරට වඩා තෙගුණ වී ඇත. වැව්, අමුණු, මහා මාර්ග ආදිය දියුණු කිරීමට රජයත් පළාත් වාසී ජනතාවත් මහත් උනන්දුව කින් කටයුතු කරන්නේ ස්වකීය ගොවිතැන් කටයුතු වලින් උපරිම පල නෙලා ගැනීම සඳහා යයි කිව හැක.

පසුගියදා දොඹගහවෙල, කෘෂිකර්ම ව්‍යාප්ති සේවක කොටසේ දක්ෂ ගොවි සාමාජිකාවක් හමුවීමට ගලබැද්ද නම් සුන්දර ගමට ගියෙමු. මොණරාගල අම්පාර පාරේ සැතපුම් 6 ක් පමණ ගියවිට හමුවන ඓතිහාසික නටබුන් ස්ථාන රාශියක් ඇති "ගලබැද්ද" සාමකාමී දිවිපෙවෙතක් ගත

කරන කදිම ගොවි බිමකි. පුරාණයේ මෙම ගොවිබිම සරුසාර කිරිමට ජලය සැපයූ මහ වැව අද දක්නට නැත. වර්තමාන මොණරාගල -අම්පාර මහා මාර්ගය දුවන්නේ එම වැව් කණ්ඩිය මැදින් බව අපට හමුවූ එක් ගොවි මහතෙක් පෙන්වා දුන්නේය. තවදුරටත් කරුණු විස්තර කළ ඒ මහතා,

"මහත්මයා අර පෙනෙන්නේ වැවෙන් වතුර ගෙන රජවරු, බිසෝවරු වතුර නෑ බිසෝ පොකුණ" යයි තැනක් පෙන්වා අප එහි කැඳවා ගෙන ගියහ.

කළු ගලින් අලංකාරමත් ලෙස සාදා තිබූ මෙය පෙර විසූ ගලබැඳි සිංහලයාගේ දක්ෂ කම්දෑයි විමසීමට මෙන් අප සිටින තැන වූ බිසෝ පොකුණ බැලීමට වාහනයක් නැවැත් වූ පිරිසකට ඉඩදී දක්ෂ ගෙවිලිය බැලීමට දොඹගහවෙල කෘෂිකර්ම ව්‍යාප්ති සේවක විලියම් සිසිර මහතා අප කැඳවාගෙන ගියේය.

බිසෝ පොකුණේ සිට ටික දුරක් ගොස් අපි වැටකින් පැන වැට දමා සකස් වූ කදිම ගෙවත්තකට ගියෙමු. පලාතේ හැටියට නිසංසල සාමකාමී පරිසරයක් ඇති ගෙයක් ඉදිරිපිට දරු දෙදෙනෙක් සමග පන්කොළ වලින් වියා ගත් වට්ටියක මිරිස් වේලමින් සිටින කාන්තාව අප හමුවීමට ආ ගෙවිලිය බව විලියම් සිසිර මහතා විස්තර කර දුන්නේය. අප දුටු හැටියේම නැගිට ගෙට ගොස් "එන්න මහත්මයා වාඩිවෙන්න" යනුවෙන් කියන විටම, අප පිළිගත්, විනීත දක්ෂ ගෙවිලියක් බව අපටද වැටහී ගියේය.

අවුරුද්දේ මහ කන්නය පමණක් වගා කරන මඩුල්ල කොටසේ මේ ගෙවත්ත වවා තිබුණේ යල කන්නයේදී නිසා අපි කවුරුත් විමතියට පත්වීමු. අක්කර 1½ ක් පමණ වූ ගෙවත්ත ඇ කදිමට සකස් කර තිබුණි. අක්කර ¾ ක පමණ ප්‍රමාණයේ මිරිස් ද, අක්කර ¼ ක පමණ ප්‍රමාණයේ රටකජු ද සෙසු ප්‍රමාණයේ මංඤොක්කා ද වගා කොට තිබුණි. ගෙවත්තේ රටකජු දක්නට නො නොලැබුණු නිසා "කෝ මෙහි වගා කර තියෙන රටකජු" කියා ඇසූවිට, "ආ... අර ගෙයි තිබෙන ගෝනිවල තිබෙන්නේ එ රටකජු තමා, ඒවා වේලාසනින් ගැලෙව්වා" යි කියා ඇ උත්තර දුන්නාය.

මේ මිරිස් වගාවෙන් දැනට ඔබ කොපමණ ආදායමක් ලබාගෙන තිබෙනවා ද?

"මිරිස් වගාවේ අස්වැන්න හටගත් කාල යේම මට හරි වාසියක් වුනා. අමු මිරිස් ගණන් ගියා රාත්තල් එකක් රුපියල් 2.00 ගණනේ ගෙදරදීම විකුණා ගත්තා අමු මිරිස් වලින් විතරක් රු. 310.00 ක් ගත්තා. වියළි මිරිස් විකුණා රු. 495.00 ක් පමණ දැනට ලබාගෙන තිබෙනවා. තව විකුණන්න මිරිස්වලින්ද, රු. 250 ක් පමණ ගන්න පුළු වන් වේවි. කොහොම වුනත් යල කන්නයේ වගා කළ නිසා වගාවේ අන්තිම කාලය වන විට රු. 2,000 ක් පමණ සොයාගන්න බලා පොරොත්තු වෙනවා".



**ගෙවිලිය තම දරුවන් සමග**

**මේ මිරිස් වගාවට ඔබ කළ සාත්තු මොනවාද?.**

"අළුතෙන් කළ දෙයක්නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් බීජ ලබාගෙන ඒ උපදෙස් අනුව කටයුතු කළා. නිය මිත කාලයට රසායනික පොහොර යෙදුවා. කොළ කොඩවීමේ රෝගයට සති දෙකකට වරක් බෙහෙත් ගැහැව්වා. දින දෙකකට වරක් වතුර වත් කළා. වල් පැළ අතින් උගුලා විනාශ කළා. වතුර වත්කරන්න තමා ටිකක් කරදර වුනේ. අර ඇත පේන දොළට ගිහිල්ලා තමා වතුර ගේන්නේ."

"ඔබ තනියමද වතුර ගේන්නේ? මහත් මයා නැද්ද උදවු කරන්නේ?.

"එයා මට හැමවිටම උදව් කරනවා. එයා රැකියාවට ගිහිල්ලා ආවාම, අප දෙන්නාම එකතුවී තමා වතුර වත්කරන්නේ."

"එහෙනම් මහත්මයාත් කැමතියි ගොවි තැනට."

"ඔව්, එයා මම කරන ගොවිතැන් වැඩට හැමවිටම ධෛර්ය ලබාදෙනවා. එයා කාර්යාලයයේ ඉඳල ආපුහම විවේකය ගෙවන්නේ ගෙවත්තේ මොකක් හෝ වැඩක් කරමින්"

"මහත්මයා කොහේද වැඩ කරන්නේ?.

"මොණරාගල සමුපකාර කාර්යාලයයේ, එයා ගෙදර ඉඳලම රක්ෂාවට යන නිසා මට හරි පහසුයි".

"ගොවිතැනට අමතරව ඔබ විනෝදයට මොනවද කරන්නේ."

"අපේ ගොවි සමාජයේ කටයුතුවලට සහභාගි වෙනවා. මම ගොවි තැනට පෙළඹුනේ තරුණ ගොවි සමාජ කටයුතු නිසා. එහි ගැහැණු ළමයින්ට ඉගෙන ගන්න නොයෙකුත් දේ තිබෙනව".

"ඔබ විද්‍යාත්මක ගොවිතැනට ඔය තරම් ඇල්මක් දක්වන්නේ ඇයි".

"මම ජ්‍යෙෂ්ඨ විභාගය සමර්ථවුනාට පස්සේ නිකම්ම ගෙදර ඉන්න නිසා තරුණ ගොවි සමාජ කටයුතුවලට සහභාගි වුනා. එයින් පසු ගොවිතැනට ආශාවක් ඇතිවී වගා තරගවලට හෙම ඉදිරිපත් වුනා. තෑගි දිනා ගත්තා. මේ අතර මම කෘෂිකර්ම පාඨශාලාවකට තේරී අවුරුද්දක පුහුණුවක් ලබාගෙන එය අවසාන විභාගයද සමත් වුනා." කියමින් ගෙයි අල්මාරියක තැන්පත්කර තිබූ ඇගේ සහතික මිටියක් අපට පෙන්වූවාය.

සම්මාන හයක් සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය,

කෘෂිකර්ම පාඨශාලා සහතික පත්‍රය.

වගා තරඟවලින් මීට ඉහත දිනාගත් සහතික පත්‍ර රාශියක් අපට ඇය පෙන්නුවාය. "මෙපමණ සහතික රාශියක් තිබිය දීත් රක්ෂාවක් ඉල්ලුවේ නැද්ද"යි මා ඇසූවිට ඈ කියා සිටියේ,

"මම රක්ෂාවලට කීපවතාවක්ම ඉල්ලුවා. ඒත් තේරුනේ නෑ. මම එයින් අධෛර්ය මත් වුනේ නැහැ. ඊට පස්සේ ගොවිතැන් වැඩවලට පෙළඹුනා. ගෙදර නිකම්ම ඉන්න

එළවළු වගාවක දී



ගමන් ඉගෙන ගත්ත දෙයින් ප්‍රයෝජන යක් ගන්න ඕන නිසා... මම දනට ගොවි තැන් වලින් හොඳ ප්‍රතිඵල ලබා තිබෙනවා. හැම තරුණ තරුණියක්ම විද්‍යානුකූලව, ධෛර්යයෙන් ගොවිතැන් කරනවා නම් රක්ෂාවකට වඩා හොඳ ආදායමක් ලබා ගන්න පුළුවනි. උනන්දුවත්, ඕනෑකමක් ඇත්නම් එක ඒ තරම් අමාරු දෙයක් නොවේ. එහෙම වුනාට ඉගෙන ගත්ත කෙනෙක් නිතරම රක්ෂාවක් බලාපො රොත්තු වෙනවා. ඒක තමයි අද බොහෝ තරුණ තරුණියන්ට වී තිබෙන්නේ ".

"කොහොම වුනත් මගේ නිලන්ති දුවත්, මංජුල පුතාත් බලාගෙන විද්‍යානුකූල ගොවිතැනක් කර ආදායමක් ලබාගෙන ජීවත්වීම නිසා මට හරි සතුටක් තියෙන වායි" තොරතුරු කියමින් ඈ ප්‍රීති සුසුමක් හෙළුවාය.

"මේ ඉදිරි මාස් කන්නයේත් වගා කිරීමට බලාපොරොත්තු වෙනවද ? "

"ඇයි නැත්තේ, මේ කන්නයේත් අක්කර දෙකක් පමණ මේ දිනවල මිනිසුන් යොදවා කැලය ශුද්ධ කරනවා"

"මොනවාද එහි වගාකරන්නේ ?."

"සම්පූර්ණයෙන්ම මිරිස් වගා කරනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අළුත් භෝග වර්ග මොකුත් ලැබුණොත් ඒවාත් වගා කරන්න බලාපොරොත්තු වෙනවා. රතුළූණු ටිකක් හදන්න, බලාපොරොත්තු වෙනවා."

"ඇයි, ඔබ රතුළූණු හා මිරිස්ම වගා කරන්න බලාපොරොත්තුවන්නේ ?."

"ඒවා ඕන තරමක් ගෙදරදීම අලෙවි කරන්න පුළුවන්. ඒ වගේම හොඳ මිලක් ගන්නත් පුළුවනි. ඒ නිසා මම ඒවා වගා කිරීමට ඉතාමත් ආශයි."

"ඔබගේ ගොවි සමාජයේ අනිත් අය වගා කරන්නේ නැද්ද ? "

"ඒ අයත් හැමෝම වගා කරනවා. ඒත් යල කන්නයේ ගෙවත්තේ වගා කළේ මම විතරයි. යල කන්නයේ ජල හිඟය නිසා බොහෝදෙනා වගා කරන්නේ නැත්තේ නියඟයට මැරෙන නිසා."

"මොකක්ද ඔබ සාමාජිකත්වය දරණ තරුණ ගොවි සමාජය ?."

"ගලබැද්ද "පුබුදු තරුණ" ගොවි සමා ජය. තවද, මම සේවයක් වශයෙන් සිය ඔලාණ්ඩුව මහ කළුගොල්ල තරුණ ගොවි සමාජයේ සාමාජිකයින්ට පන්ති පැවැත් වුවා. දැන් ගොවිතැන් කටයුතු නිසා එහි යන්නේ නෑ."

"මොනවාද එය පන්තිවල සේවයක් වශයෙන් ඔබ උගන්වන්නේ ? "

"ඉහුම් පිහුම් වැඩ හා විද්‍යානුකූල ගොවි තැන. තරුණ ගෙවිලියන්ට අවශ්‍ය දේ."

කෙසේ හෝ වේවා, බොහෝ උගත් තරුණියන්ට වඩා හාත්පසින්ම වෙනස් ජීවිතයක් ගත කරන මේ ආදර්ශමත් ගෙවි ලිය හැමට ආදර්ශයක් වේවායි! පතමින් ඇයට ස්තුති කොට පෙරකල දිගාමඩුල්ල ශ්‍රී සමෘද්ධියෙන් බැබලුණ බවට දෙස්දෙන බිසෝ පොකුණු වැව් කණ්ඩිය අතරින් දහ වල් බත සඳහා ආපසු නවාතැනට ආවෙමු.

අළුත් යුගයක ඉදිරියට ගොස් දියුනුවේ මාවත දකින්නට
නැවුම් බවකින් ඉදිරිපත්වන උසස් දැණුමක් ලබා ගන්නට
අපේ ගොවිතැන නංවමින් හැම අහලකින් අස්වනු නෙලන්නට
සැවොම " ගොවිකම් සඟර " කියවා අදම සැරසෙන් වැඩකරන්නට